# එකමුතුකම



# එකමුතුකම

D.M රුහාරා අමාශි

# එකමුතුකම

**D.M** රුහාරා අමාගි

**2 ශ්‍රේණිය**

**මහ / මාහාමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

IS 37764

# පිදුම.

පුංචි අපට හොඳ නරක සහ අකුරු කියා දෙන
විදුහල්පතිතුමියට සහ පන්තිභාර ගුරුතුමියට බැති සිතින්
පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණු රටක සංවර්ධනය මනින මැනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමයා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ද කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්විම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපකාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්ට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතා හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා ද අතවැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමයා බාලිකා විද්‍යාලය- මහනුවර.



දවසක් කැලේ මැදින් ඇවිදගෙන ගියපු මොනරෙකුට
පුංචි ලේන් පැටවෙක් හමු වුණා.




ලේන් පැටියා හොඳටම අඬ අඬා හිටියේ. මේ ලේන් පැටියා අඬනවා මොනරා දැක්කා."ඇයි ඔයා අඬන්නේ?" මොනරා ඇහුවා.



"මගේ අම්මයි තාත්තායි කෑම හොයන්න ගියා. තාම ආවේ නැහැ. මට ගොඩක් බයයි. එයාලා හොයන්න මට උදව් කරන්නකෝ" ලේන් පැටියා කිව්වා.



මේ දෙන්නා ලේන් අම්මයි තාත්තායි හොයන්න ගියා. මඟ දී වෙල් යායක් හමුවුණා.වෙල් යායේ ඈතින් කෑගහන ශබ්දයක් ඇහුණා.ලේන් පැටියා විපරම් කර බැලුවා.



ලේන් පැටියාගේ අම්මයි තාත්තායි ළිඳකට වැටිලා ඉන්නවා පැටියා දැක්කා.

"අනේ........! උදව් කරන්න කවුරුත් නැද්ද ?"


ලේන් පැටියා කෑගහන්න පටන් ගත්තා.



මේක ඇහුණ අලි හාමියි, වඳුරු හාමියි ලේන් පැටියාට උදව් කරන්න දුවගෙන ආවා.



අලිහාමි දැක්ක ගමන් කුඹුරේ හිටපු ගොවියා බයවෙලා දිව්වා.



ඔන්න එතකොට අලි හාමි ළිඳට එබුනා. අලි හාමිගේ
දිග හොඬවැලේ එල්ලිලා වඳුරු හාමි ළිඳේ හිටපු ලේන්
අම්මවයි තාත්තාවයි ගොඩට ගත්තා.



ගොඩට ආපු මේ දෙන්නා ලේන් පැටියාව සතුටින් බදා ගත්තා.



මේ ගොල්ලන්ට හරිම සතුටුයි. "ඔයාලා හැමෝටම බොහොම ස්තූතියි! "ලේන් අම්මයි තාත්තායි හැමෝටම ස්තූති කළා.



ඔයාලා දැක්කානේ හැමෝම තම තමන්ට පුළුවන් දේ කරලා ලේන් පවුලට උදව් කළා. පුංචි අපිටත් පුළුවන් හැකියාවන් වලින් එකිනෙකාට උදව් කර ගනිමු. එකමුතු වෙලා ජය ගනිමු.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිතය කෙතේ රෝපණය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ද කර ගැනීම විශේෂත්වයකි.මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැකවූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.මෙයට පිලියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ.තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘතිය නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්.

IS37764